# ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ කේන්ද්‍රස්ථානය සමඟ එක්වීමට ඔබටත් අනගි අවස්ථාවක්



**ශ්‍රී ලංකා මහ බැංකුව**
**இலங்கை மத்திய வங்கி**
**CENTRAL BANK OF SRI LANKA**

ශ්‍රී ලංකා මහ බැංකුවේ කළමණාකරන සහකාර පංතියේ කණිෂ්ඨ පෞද්ගලික සහකාර තනතුරට වසර දෙකක පරිවාස කාලයකට යටත්ව බඳවා ගැනීමට සළකා බැලීම සඳහා පහත දැක්වෙන සුදුසුකම් හා පළපුරුද්දක් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. කණ්ඩායම් හැඟීමෙන් සහ කැපවීමෙන් සේවය කිරීමට කැමති පුද්ගලයන් සඳහා මෙම තනතුර විවෘතය.

## කණිෂ්ඨ පෞද්ගලික සහකාර තනතුර (ඉංග්‍රීසි සහ සිංහල)

**1. නිපුණතාවයන්**

විශිෂ්ඨ සන්නිවේදන හා සංවිධාන හැකියාවන්ගෙන් යුක්ත වීම, සිංහල හා ඉංග්‍රීසි භාෂාවන් දෙකම ප්‍රවීණ ලෙස හැසිරවිය හැකිවීම, MS Word, MS Excel හා MS PowerPoint වැනි කාර්යාල කටයුතු සඳහා භාවිතා කරනු ලබන පරිඝණක මෘදුකාංග (Office Applications) මනා ලෙස හැසිරවිය හැකිවීම, අවස්ථානුකූලව ප්‍රමුඛතාවය අනුව වැඩ කිරීමේ හැකියාව සහ පෞද්ගලික සහකාර තනතුරට අවශ්‍ය අනෙකුත් පොදු නිපුණතාවයන්ගෙන් යුක්ත වීම

**2. වගකීම්**

රහස්‍යභාවය ඉහළ මට්ටමෙන් රැකගැනීමේ හැකියාව, ආයතනයට ඇති පක්ෂපාතීත්වය හා කලට වේලාවට වැඩ කිරීමේ හැකියාව, විවිධ අවස්ථා සම්බන්ධීකරණය කිරීමේ හැකියාව හා ඒ අනුව දින පොත නඩත්තු කිරීම, අභ්‍යන්තර හා බාහිර පාර්ශව සමග සම්බන්ධීකරණය කිරීම, ස්වාධීනව ලිපි කටයුතු පිළියෙල කිරීමේ හැකියාව සහ අනුලියනය හා යතුරු ලියනය හා කණිෂ්ඨ පෞද්ගලික සහකාර තනතුරට අදාල අනෙකුත් වගකීම් දැරීමේ හැකියාව

**3. සුදුසුකම් සහ පළපුරුද්ද**

- **අධ්‍යාපන සුදුසුකම්**

අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි සහ සිංහල භාෂාවන් ඇතුළුව විෂයයන් හතරක් (04) සඳහා සම්මාන සාමාර්ථ සහිතව ගණිතය විෂයය ඇතුළුව අවම වශයෙන් විෂයයන් හයක් (06) සමත්ව තිබීම

**සහ**

අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී ඕනෑම විෂය ධාරාවක් යටතේ අවම වශයෙන් ප්‍රධාන විෂයයන් තුන (03) එක් වරකදී සමත්ව තිබීම

- **වෘත්තීය සුදුසුකම්**

මහ බැංකුවට පිළිගත හැකි ආයතනයකින් ඉංග්‍රීසි/සිංහල ලඝුලේඛන (Shorthand) සහ/හෝ පිටු සැකසුම් කිරීම/යතුරුලියනය (Typesetting/Typewriting) පිළිබඳ වෘත්තීය ඩිප්ලෝමා/සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව අවසන් කර තිබීම

- **පළපුරුද්ද**

පිළිගත් ආයතනයක ඉංග්‍රීසි/සිංහල පිටු සැකසුම් කිරීම/යතුරුලියනය (Typesetting/ Typing) පිළිබඳ අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් තිබීම සහ Windows සහ Apple Mac යන පරිගණක පද්ධති දෙක තුළ Office පැකේජය මනා ලෙස හැසිරවිය හැකිවීම

- **අමතර සුදුසුකම්**

දෙමළ භාෂාවෙන් කටයුතු කිරීමේ හැකියාව

**4. වයස**

**2019 සැප්තැම්බර් 12** වන දිනට වයස **අවුරුදු 35 ට** නොවැඩි විය යුතුය.

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්දට අදාළ සහතිකවල ඡායා පිටපත් යොමු කිරීමට අයදුම්කරුවන් වග බලා ගත යුතුය. එම සහතිකවල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවකදී කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**5. වැටුප් හා දීමනා**

ආකර්ෂණීය වැටුපක් සමග මාස දෙකක දළ වැටුපට සමාන වාර්ෂික විශේෂ දීමනාවක්, අර්ථසාධක අරමුදල, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල, වෛද්‍ය පහසුකම් හා සේවක ණය පහසුකම්, විශ්‍රාම ප්‍රතිලාභ සහ පුහුණුවීම් අවස්ථා

## තෝරා ගැනීමේ පිළිවෙල

මේ සම්බන්ධයෙන් පවත්වනු ලබන නිපුණතා පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු මත පදනම්ව අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

නිපුණතා පරීක්ෂණයේ දී සහ සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවයන් මත පදනම්ව අවසන් තෝරා ගැනීම සිදු කරනු ලබයි. නිපුණතා පරීක්ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. යතුරුලිවීමේ හැකියාව ඉංග්‍රීසි සහ සිංහල යන මාධ්‍යය දෙකෙන්ම පරීක්ෂා කරනු ලැබේ.

## අයදුම්පත්

නියමිත ආකෘති පත්‍රයට අනුව සකස් කළ අයදුම්පත් **2019 සැප්තැම්බර් 12** වන දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ/මානව සම්පත් වෙත ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත් පමණක් ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් වග බලා ගත යුතුය.

මහ බැංකුවේ වෙබ් අඩවිය වන **http://www.cbsl.gov.lk** මගින් නියමිත අයදුම්පත් ආකෘති පත්‍රය ලබා ගත හැකිය.

අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත්, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හෝ නියමිත ආකෘතියෙන් බැහැර වූ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අපේක්ෂිත සුදුසුකම් සපුරා නොමැති තැනැත්තන් මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබන අතර අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයේදී අදාල සහතිකපත්‍ර වල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් කවර හේතුවක් යටතේ හෝ මෙම තනතුර සඳහා පත් කර ගනු නොලබයි.

කනිෂ්ඨ පෞද්ගලික සහකාරවරුන්/වරියන් කළමණාකාරිත්වයේ උපදෙස් පරිදි දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කළ යුතු වේ.

තෝරා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීමට තැත් කිරීම බඳවා ගැනීම සඳහා නුසුදුසුකමක් වේ.

පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව තීරණය කිරීම සහ බඳවා ගැනීමේ ක්‍රියාවලිය කල් දැමීම හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය.

**අධ්‍යක්ෂ-මානව සම්පත්**
**ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01**
**දුරකථන : 0112477330 ෆැක්ස් : 0112477715**